සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**13 ශ්‍රේණිය** — **පෙරදිග සංගීතය** — **පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

01. (3) 02. (5) 03. (2) 04. (2) 05. (3) 06. (1) 07. (2) 08. (2) 09. (2) 10. (1)

11. ෂෙනායි නාදස්වරම්
12. යුරිසිඩ්
13. භෛරවී
14. අසිස්චන්ද්‍ර බෙනර්ජී
15. F Major Scale
16. පැල් ගී, ගැල් ගී
17. තානම, කවිය, ඉරට්ටිය
18. සමුද්‍රඝෝෂ විරිත
19. මාර්ග සංගීතය
20. ධවනි පූර්ණ වචන යොදා තිබීම.

21. (2) 22. (2) 23. (4) 24. (4) 25. (3) 26. (3) 27. ( 3 ) 28. ( 4) 29. (2)

30. සමග්‍රහය (x)
31. ජෞනපුරි
32. තිලවඩා, එන්තාල්
33. සන්තූර්
34. මහනුවර
35. හොවාර්ඩ් ගාඩ්නර්
36. පල්ලවී, අනුපල්ලවී
37. තේමා සංගීතය මුළු සංවධනිය පුරා පැතිරීම.
38. Trumpat, cornet
39. ජග්ගිත් සිං, එන්කජ් උදාස්
40. කයදා, එල්ටා
41. මකුලොලුව මහතාගේ
42. ජෞනපුරි
43. ශුද්ධතාන්
44. තබ්ලාවෙන් පක්වාජයෙන්
45. ජේ. එස්. බාග්
46. පංචාංගික තූර්ය, පසඟතුරු
47. ප්‍රේමසිරි ඛේමදාස ශූරීන්
48. මාලිකෞනිස් හා බහාර්
49. උඩරට
50. වැලපුම් ගී

(ලකුණු 100)

## II පත්‍රය

01. (i) (අ) දේශ් (ආ) බ්‍රින්දාමනි සාරංග (ඉ) හමීර් (ඊ) බාගේශ්‍රී

(ii) <u>බ්‍රින්දාමනී සාරංග</u>

ආරෝහණ : නි ස රි ම ප නි සං — අවරෝ: ස <u>නි</u> ප ම රි ස

මුඛ්‍යාංගය : නි ස රි, ම රි, ප ම රි ස — ඨාටය කාෆි වාදි රි සංවාදි ප

ගානසමය මධ්‍යහන කාලය — ජාතිය ඖඩව ඖඩව

(iii) බ්‍රින්දාමනී රාගය

මප නිසං රිංමං රිංසං | රිං නි සං රිං | සං නිනි පම | රි ස ස
නාඃ ඃඃ ඃඃ ඃඃ | ඃ බෝ ලො | ශ්‍යා ඃ මඃ හඃ | මී ඃ ස ත
නි ස ස | රි ස ස | නිස රිම ප<u>නි</u> <u>නි</u>ප | මප රි ස
ජා ඃ න ග | රි තු ම | රේඃ ඃඃ ඃඃ ඃඃ | ඃඃ ඩා ඃ ග

ම ප නි | සං සං | නි සං රිං සං | සං සං <u>නි</u> ප
කු බ ජා ඃ | නා ඃ රි ඃ | අ ති ම න | භා රි ඃ
<u>නි</u> ප රි - | රි - ස ස | නිස රිම ප<u>නි</u> නිප | මප රි ස
අ බ නෛ ඃ | සෝ ඃ හ ම | රෝඃ ඃඃ ඃඃ ඃඃ | ඃඃ සං ඃ ග

(iv) මම මම ගම ධම | <u>ග</u>ම ධ<u>නි</u> ධම <u>ග</u>ම | මධ නි<u>ධ</u> ගම ධම | ම<u>ග</u> ම<u>ග</u> රිස නිස
ධනි සධ නිස ධනි | ධනි සම ගරි ස
මගු මධ නිසං නිධ | මගු මගු රිස නිසං
ධ<u>නි</u> සංමං <u>ගු</u>රිං සං | <u>නි</u>සං <u>නි</u>ධ මධ නිසං |

02. (i) a - බිහාග් b - ආශාවරී c - මල්කෞන්ස් d - බහාර්

(ii)

| | |
|---|---|
| බිහාග් | ස රි ග ම ප ධ නි |
| ආශාවරී | ස රි <u>ග</u> ම ප <u>ධ</u> <u>නි</u> |
| මල්කෞන්ස් | ස <u>රි</u> <u>ග</u> ම ප <u>ධ</u> <u>නි</u> |
| බහාර් | ස රි <u>ග</u> ම ප ධ <u>නි</u> |

(iii) බහාර් සමමප, ගමරිස, නිසගමගරිස, පගමධ, ගමරිස නිසග, මප, ගමධ, නිධ, ම, ප, ගමරිස, පග, මනිධ, හිසි රිනිස නිප, මපග, මධ, නිස, නිධනිසි, සිරිනිසි, ගමධනිසි ගිමිරිසි, ධ, නිසි, නිසිරිනිසි, නිධ, නිසි, සිනිප, නිනිපම, ගමරිස

(iv) බිහාග් සර්ගම්

ග ස | ග ම | ප නි ප | ග ම

ග ස | නි ප | ම ප ම | ග ස

නි ස ග ම | ප නි ප | ග ම | ග ස

03. (i) ධ්‍රැපද් ධමාර්

◆ මෙම ගායනා ක්‍රම දෙකම හින්දුස්ථානි සංගීත සම්ප්‍රදායේ එන පැරණි ගායනා ශෛලීන් දෙකකි. ◆ ධ්‍රැපද් චෞතාල් සුල්තාල් වැනි තාල මත නිර්මාණය වී ඇති අතර ධමාර්, ධමාර් තාලය මත නිර්මාණය වී ඇත. ◆ ධ්‍රැපද් ගීත දෙවියන්ගේ ගුණ ඇතුළත් කොට නිර්මාණය වී ඇති අතර ධමාර් ගීත බොහෝ විට ඍතු වර්ණනා වලින් යුක්තය. ◆ ධ්‍රැපද් සඳහා ගුරුකුල 04 ක් භාවිතා වන අතර, ධමාර්වල එසේ නැත. ◆ මෙම වර්ග දෙකම මූලිකව විලම්භලයෙන් පටන් ගෙන දෙගුණ තුන්ගුණ චතුර්ගුණව ගායනා කරයි.

(ii) ගසල් ප්‍රේමගීත ඇතුලත් ගීත විශේෂයකි. උර්දු, පර්සියන්, හින්දි ව්‍රජ ආදී භාෂාවලින් මේ ගීත රචනා වී ඇත. මෙම ගායන ශෛලිය හඳුන්වා දෙන ලද්දේ අමීර් ඛුෂ්රු විසිනි. ගසල් ගීත නිර්මාණාත්මකව ගායනය කළ හැක. භජන් මෙන් මූලික නාදමාලාව තුළ නොරැඳී විවිධ පැතිකරා ගමන් කිරීමක් දක්නට ලැබේ. රාග ආශ්‍රිතව ගසල් ගීත නිර්මාණය වී ඇත. සංගීත භාණ්ඩ වැඩි ප්‍රමාණයක් යොදා ගනිමින් ගසල් ගයති. මෙහිදී බටහිර සංගීත භාණ්ඩ යොදා ගැනීමද වර්තමානයේ දැකිය හැකිය.

ජග්ගිත් සිං මොහු ඉන්දියාවේ සුප්‍රසිද්ධ ගසල් ගායකයෙකි. මොහු හින්දි, පංජාබි, උර්දු, බෙංගාලි, ගුජරාටි ආදි භාෂාවන්ගෙන් ගසල් ගීත විශේෂ ප්‍රමාණයක් ගායනා කර ඇත. ක්ෂේත්‍ර විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ උපාධියක් ලබා ඇත. 1976 H.M.V.L.P. තැටි විශාල ප්‍රමාණයක් එළි දක්වා ඇත. ජග්ගිත් සිං ගේ සුවිශේෂීත්වය වන්නේ පැහැදිලි කටහඬ හා අර්ධ ශාස්ත්‍රීයබව ගසල් ගායනා තුළින් මනාව පැහැදිලි වීමයි.

(iii)

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| x | | | | | 2 | | 0 | | | 3 | | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| ක | ධි | ට | ධි | ට | ධා | | ගෙ | ති | ට | ති | ට | තා | |

දෙගුණය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කධි | ටධි | ටධා | ගෙ | තිට | තිට | තාs | කධි | ටධි | ටධා | ගෙ | තිට | තිට | තා |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| x | | | | | 2 | | 0 | | | 3 | | | |

04. (i) සේ ගී උගතුන් විසින් රචනා කරන ලද ගී විශේෂයකි. මෙම ගීතවල භාෂාව ගැඹුරුය. නාද මාලා සංකීර්ණය. විවිධ විරිත් අනුව ගීත නිර්මාණය කර ඇත. උගතුන්ගේ පණ්ඩිතත්වය පෙන්වීමට මෙලෙස ගීත නිර්මාණය කර ඇත. එළිසමය, එළිවැට, අනුප්‍රාස වැනි කාව්‍ය රීතීන්ගෙන් මේ ගීත සැදුම්ලත් ය. වන්නම්, ප්‍රශස්ති, සංදේශ කාව්‍ය, ගුත්තිල කව්‍ය, හටන් ගී වැලපුම් ගී මේ යටතේ ගත හැකිය.

(ii) ප්‍රශස්ති හා හටන් ගී මහනුවර යුගයේ ප්‍රචලිත වූ සංගීතාංග වේ. මේ ගී වර්ග දෙකම සේ ගී සනයට අයත් වේ. කර්ණාට සංගීතයේ බලපෑම මේ ගීතාංග දෙකටම බලපෑ ඇත. එම ගීත වල යොදා ඇති මිශ්‍ර භාෂාවන් දෙස බලනවිට මේවා මනාවට පැහැදිලිවේ. නාදමාලා සංකීර්ණය. ත්‍රිවිධ සප්තක ඇසුරු කරන නාදමාලා දක්නට ලැබේ. මහනුවර කවිකාරමඩුව මෙම සංගීතාංග සඳහාම වෙන්වූ තැනකි. මෙවැනි සංගීතාංග බිහිවීමට හේතු වූයේ මහනුවර යුගයේ රජවරුන් හා දකුණු ඉන්දියාව අතර පැවති සබඳතාවයකි. මෙම ගීත පැවැත්ම හා විකාශනය වන්නේ ග්‍රන්ථ ඇසුරිනි.

05. (i) ගැමි ගී වර්ග මෙහෙ ගී (වෘත්තීන් හා බැඳි ගී)

ඇදහිලි හා විශ්වාස මත බැඳි ගී

විනෝදාස්වාදය හා සමාජ අවශ්‍යතා මත බැඳි ගී (කෙළි ගී)

ගැමි ගී ආඝාතාත්මක මෙන්ම අනාඝාතාත්මක ලෙස වර්ග වී ඇත. මෙහෙ ගී බොහොමයක් අනාඝාතාත්මක ගායනා කරයි. ඒ මන්ද විවිධ වෘත්තීන් හා සම්බන්ධ මෙම ගීත වල එදා ජනයාගේ දුක කඳුල මතින් ගත කළ

ජීවන රටාවන් පිළිබඳ චිත්‍රයක් මවයි. කෘෂිකාර්මික ජීවනෝපාය මගින් ජීවත් වූ ගැමි ජනයාට එම කාර්යන් තුළ තිබූ දුෂ්කර භාවය නිසාම තාලයකින් තොරව අනාඝාතාත්මකව මේ ගීත ගායනා කර ඇත. මේ ගැමි ගී සාමාන්‍ය ජනතාවට තේරුම් ගත හැකි සරල භාෂාවක් හා ගැමි ජනයාගේ සිතුම් පැතුම් මේ ගී විශේෂය සඳහා යොදා ගෙන ඇත. එක් එක් ගැමි ගී වර්ග සඳහා සුදුසු නාදමාලා හා තාල යොදා ගැනීමට ගැමි ගී නිර්මාණකරුවා උත්සාහ ගෙන ඇත.

(ii) උඩරට, පහතරට, සබරගමු වශයෙන් වන්නම් වර්ග 3 ක් යටතේ දැකිය හැකිය. ඒ ඒ ප්‍රදේශවලට ආවේනික ලක්ෂණ මෙම ගීතවල හා වන්නම් විශේෂයෙහි දක්නට ලැබේ. උඩරට ප්‍රදේශයට ආවේනික වන්නම් 18 කි. උඩරට වන්නම් ආරම්භ වූයේ මහනුවර රජ කළ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ සමයෙහිය. එවකට රාජසභාවේ රජ කළ ගණිතාලංකාර නම් පඬිවරයා විසින් උඩරට වන්නම් රචනා කළ බව සඳහන් වේ. මේ සඳහා ප්‍රධාන තාලවාද්‍ය භාණ්ඩය ලෙස ගැටබෙරය යොදා ගනී. තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව වැනි කොටස් උඩරට වන්නමක දක්නට ලැබේ.

සබරගමු වන්නම් ආරම්භය පිළිබඳ නොයෙක් මත පළවී ඇත. කෙසේ වෙතත් පසුකාලීනව පොත්පත් වල සඳහන් අන්දමට කලවානේ ධර්මාලංකාර අතපත්තු විසින් නිර්මාණය කළ බව කියැවේ. ප්‍රධාන වාද්‍ය භාණ්ඩය දවුලයි. මේ වන්නම් වලින් කියැවෙන්නේ සතෙකුගේ පුද්ගලයෙකුගේ වර්නාවයි. සබරගමු වන්නම තානම, කවිය, කලාසම, අඩව්ව ආදී කොටස් වලින් යුක්ත වේ. උපුල්වන් දෙවිඳු උදෙසා 6 වන පරාක්‍රමබාහු රජු විසින් පහතරට වන්නම් නිර්මාණය කරන ලදැයි කියැවේ. පහතරට වන්නම් සින්දුවන්නම් ලෙසද නම් කෙරේ. මේවා 32 කි. ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩ යක්බෙරයයි. තානම, කවිය, ඉරට්ටිය යන කොටස් පහතරට වන්නමක දක්නට ලැබේ.

(iii) මෙහෙ ගී නිර්මාණය වී ඇත්තේ ගැමියාගේ ජීවන වෘත්තීන් මතයි. ජීවන වෘත්තීන් වල ස්වභාවයද එකිනෙකට වෙනස් ය. ගැල්, පැල්, පාරු වැනි කාර්යයන් එකල කරනු ලැබූ කාර්යයන්ය. ඒ අවස්ථාවේ ගැමියා තමා කරන කාර්යයේ ස්වභාවය දුෂ්කරතාවය, පෙන්නුම් කිරීම සඳහා එම ගීත ඇද පැද දීර්ඝ යති යොදා ගායනා කර ඇත. එම ව්‍යන්තීන්වල ජනයා ලබන්නේ කටුක අත්දැකීම් ය. එමනිසා මෙහෙ ගී බොහොමයක් අනාඝාතාත්මක වීමට හේතු වී ඇත.

06. (i) + ස ප ප | ප ධ ප | ම ධ ප ම | ග රි ස නි

\+ සරි ග ම | ග රි ග රි | ස රිග | ම ග රි ස

(ii) $B^b$ C D $E^b$ F G A $B^b$

(iii)

| | | |
|---|---|---|
| wood wind | - | Flute, piccalo |
| Bass | - | Horn, Trumpet |
| String | - | violin, cello |
| percussion | - | Bass Drum, Timpani |

(iv)
1. ට්‍රෙබල් ක්ලේෆ් බටහිර ප්‍රස්ථාරයක මධ්‍ය ස සිට උච්ච ස්වර සටහන් කරන කොටස ට්‍රෙබල් ක්ලෙෆ් වේ.
2. Flat - බටහිර සංගීතයේ කෝමල ස්වර මේ සංකේතයෙන් දැක්වේ.
3. $\frac{4}{4}$ - මෙය Time signature යයි. බටහිර සංගීතයේ තාලය හඟවන සංකේතයයි.
4. 𝄾 ක්‍රොඩර්ට් රෙස්ට් සංකේතය මාත්‍රාවක නිහඬ මාත්‍රාවක් මෙයින් දැක්වේ.

07. (i) ◆ සංධවනිය කිසියම් තේමාවක් මත තිබිය යුතුය. ◆ එක් නාද රූපයක් මුළු සංධවනිය පුරාම විහිදී ඇත. ◆ සංධවනියක් මෙහෙයවන්නෙක් සිටියි. ◆ විවිධ ස්වර පරාසවලට අදාළ විවිධ සංගීත භාණ්ඩ රාශියක් භාවිතා කරයි. ◆ වයලින් පවුලේ සියළුම භාණ්ඩ යොදා ගනියි.

(ii) ඔපෙරාවක් යනු ගීත නාටකයක් ලෙස හැඳින්විය හැක. ඔපෙරාවක ගීත, වාදිත සහ නෘත්‍ය යන ත්‍රිවිධ අංගයන්ම ඇත. එසේම ඔපෙරාවක වැදගත්ම අංගය ගායනයයි. ගායනයේදී සුවිශේෂී කටහඬ, හඬතල මත පිහිටා විකාශනය කරයි. ඒ තුළින් හැඟීම් ප්‍රකාශනය ද සිදු කෙරේ. මිනිස් කටහඬ උපරිමය ගිය තැන ඔපෙරාවක් බිහිවන බව කියැවේ.

(iii) මුද්‍රා නාටකයක් යනු සතර අභිනයෙන් වාචික අභිනය හැර ආංගික, සාත්වික හා ආහාර්ය යන අභින තුනෙන් පෝෂණය වූවක් බව කිවහැක. මෙම අභින තුන ගෙන හැර දැක්වීම සඳහා මූලික වන්නේ සංගීතයයි. ආංගික අභිනය යනු නළුවන් අතින් පයින් හා ශරීරයේ වෙනත් අංග වලින් කෙරෙන අභිනයයි. සාත්වික අභිනය යනු

නළුවන් තම මුහුණට ආරූඪ කරගන්නා වූ විලාශයන් දැක්වීමයි. නළුවන්ගේ අඳුම් පැළඳුම් හා වෙනත් වේදිකා උපකරණයන් ආහාර්ය අභිනය ලෙස දැක්වෙයි. ඉහත සඳහන් අභිනයන්ගෙන් සාත්වික හා ආංගික අභිනව වල සියළු කාර්යයන් සංගීතය මත සිදු කරන නිසා මුද්‍රා නාටකයක සංගීතය ඉතා වැදගත් තැනක් ගනී.

08. (i) භාරතීය සංගීතයේ ප්‍රභවය සඳහා වෛදික යුගයේ වේදගායනා උපයෝගී කරගෙන ඇති බවට හේතු සාධක රාශියකි. වේද ගායනා ප්‍රථමයෙන් ඇරමුනේ 'ඕම්' කාර ගායනයෙනි. මෙම ඕම් කාර ගායන කර ඇත්තේ එක් ස්වරයක් මත පිහිටා ගෙනයි. පසුව එය ස්වර 2, 3, 4 ආදී වශයෙන් ගායනා කර ඇත. එක් ස්වරයක් මත පිහිටා ගැයීම ආර්ථක ලෙසද, ස්වර 2 ක් මත පිහිටා ගැයීම ගාථක ලෙසද, ස්වර 3 ක් මත පිහිටා ගැයීම සාමික ලෙසද, ස්වර 4 ක් මත පිහිටා ගැයීම සවරාන්තරික ලෙසද නම් කරන ලදී. එසේම වේද ගායනාවන් උදාන්ත, අනුදාන්ත සවරිත වශයෙන් ද කොටස් තුනකින් යුක්ත විය. උදාන්ත යනු උස් හඬයි. අනුදාන්ත යනු පහත් හඬය. උදාන්ත අනුදාන්ත අතර සාමාන්‍ය හඬ ස්වරිත වශයෙන් හැඳින්විය. වේද ගායනයේ එම ගායනා කරන ස්ථාන පෙන්වීම සඳහා ලකුණක් යොදා පෙන්වන ලදී. ඒ අනුව / ලකුණින් උස්නාද ස්ථානයක ගායනා කළ යුතු තැනද  ලකුණින් පහත් නාද ස්ථානයක ගායනා කළ යුතු තැනද, ලකුණක් නොමැති තැන මධ්‍යස්ථ හඬින් ගායනා කළ යුතුය යන්න පෙන්වා දී ඇත.

ස්වර ප්‍රස්තාරකරණය පිළිබඳ ඓතිහාසික තොරතුරු සාම ගීතිකා වලින් පැහැදිලිවන බව චතුර්වේදයෙහි එන සාම වේදය සංගීතය අන්තර් ගත කොට ලියවුනකි. සාමන යන වචනයෙන් භාවමය යන අදහස දේ. සාම ගීතිකාවන්හි තිරස් හා සිරස් රේඛා මගින් නාද ස්ථානද දක්වා ඇත. එසේම උදාන්ත, අනුදාන්ත, ස්වරිත වූ නාද ස්ථාන 3 ක් මත මෙම ගීතිකා ගායනා කර ඇත. පසු කලෙක කිසියම් ප්‍රස්තාර ක්‍රමයක් මත සාම ගීතිකා ලියා ඇති බව පෙනේ. වේද ගායනා හා සම්බන්ධ ගීතිකා ඇති ගාන නම් ග්‍රන්ථ වල ගීතිකා ගැයිය යුතු ආකාරය දක්වා ඇත්තේ 123456 ආදී වශයෙන් අංක කිරීමෙනි. 1  6 දක්වා අංකනය වූයේ ගායනයේදී යොදා ගත යුතු නාදස්ථාන වශයෙනි. ඒ අනුව රාග සංකල්පය වේද ගායනාවන්ගෙන් ඇති වූවක් බව කීම නිවැරදි ය.

(ii) ගෝත්‍රික ගීත තුළින් භාරතීය සංගීතයේ වර්ධනයට යම්කිසි පටුවහලක් ලැබී ඇති බව පැහැදිලි වේ. පංජාබ් ප්‍රදේශයේ ඔරු පදින්නන් විසින් ගයන ලද ගී බටියාලි ගී නමින් හැඳින් වේ. එසේම තාපස වේෂයෙන් සිටි ගෝත්‍රිකයින් විසින් බාවුල් ගී නමින් ගී විශේෂයක් ගායනා කර ඇත. මේ ගීත වල නාදමාලා වලින් වංග සංගීතය නිර්මාණය කර ඇත. උ .භාරතීය ටප්පා ගායනයද ග්‍රෝත්‍රික ගී විශේෂයකි. මෙම ගායන ශෛලිය පංජාබ් ප්‍රදේශයේ ඔටුපල්ලන්ගේ ගායනා ඇසුරින් සකස් වී ඇති ගීත ශෛලියක් බව කියැවේ. රණකාමී ගෝත්‍රික විශේෂයන්ගෙන් මාලාව නම් රාගයද, අභිරාස් ගෝත්‍රිකයන්ගෙන් අහීර් නම් රාගයද ආදී ආකාරයට මේ කරුණු දෙස බැලීමේදී ගෝත්‍රික ගී තුළින් රාග නිර්මාණය වී ඇති බව පෙන්වයි.